# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.19 පැය 0615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/775/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම.

2025.04.18 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඔරුගොඩවත්ත ප්‍රදේශයේදී පහරදීමක් හේතුවෙන් රෝහල් ගත කල පුද්ගලයෙකු මියගොස් ඇති බවට ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා ඔහුගේ පුත්‍රයා අතර ඇති වූ ආරවුලක් දුරදිග යාම හේතුවෙන් පුත්‍රයා විසින් යකඩ පොල්ලකින් මරණකරුගේ හිසට පහරදී ඇති අතර එම පහරදීමෙන් තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව මියගොස් ඇති බවට දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර **අපරාධය සිදුකල වයස අවුරුදු 20 ක් වන මරණකරුගේ පුත්‍රයා** පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 02. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියන් තිදෙනෙකු අත්අඩංගුවට - ගුවන්තොටුපොල පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය.

2025.04.18 වන දින රාත්‍රී කාලයේ කටුනායක පොලිස් වසමේ කටුනායක ගුවන්තොටුපොල පැමිණීමේ පයර්න්තයේදී ගුවන්තොටුපොල පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත බැංකොක් සිට මෙරට ගුවන්යානයකින් පැමිණි කාන්තාවන් තිදෙනෙකු පරීක්ෂා කර කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 104 ක් සමඟ සැකකාරියක්, කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 856 ක් සමඟ සැකකාරියක් සහ කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 02 ග්‍රෑම් 288 ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරියන් අවුරුදු 25, 48 සහ 50 වයස්වල පසුවන වැල්ලම්පිටිය සහ මාලිගාවත්ත ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

ගුවන්තොටුපොල පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.

2025.04.18 වන දින අළුයම් කාලයේ කොම්පඤ්ඤවීදිය පොලිස් වසමේ ඕඩියන් හන්දිය අසලදී කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 214 ක් මිලිග්‍රෑම් 880 ක් සන්තකයේ තබාගනිමින් ත්‍රීරෝද රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ත්‍රීරෝද රථයද සමඟ අත්අඩංගුවට ගෙන කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 49 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොම්පඤ්ඤවීදිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය.

2025.04.18 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 120 ක් සන්තකයේ තබාගනිමින් මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදීම හා එම මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලදැයි සැක කල හැකි රුපියල් 311,430/- මුදලක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 52 ක් වන බඩෝවිට, ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.

2025.04.18 වන දින දහවල් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ පනාගොඩ ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 430 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බේරුවල පොලිස් ස්ථානය.

2025.04.18 වන දින රාත්‍රී කාලයේ බේරුවල පොලිස් වසමේ මහගොඩ හන්දිය අසලදී බේරුවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 850 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 32 ක් වන පැලස්පාත්, බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කිලිනොච්චිය පොලිස් වසම.

2025.04.18 වන දින සවස් කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ අම්බාල්කුලම් ප්‍රදේශයේ නිවසක් ඉදිරිපිට මිදුලේ නවතා තිබූ ටිපර් රථයකට දැරියක් යටවීමෙන් මියගොස් ඇති බවට කිලිනොච්චිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**මිය ගිය දැරිය වයස අවුරුදු 01 ½ ක් වූ අම්බාල්කුලම්, කිළිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මිය ගිය දැරියගේ පියා නිවසෙහි මිදුලේ නවතා තිබූ ටිපර් රථය පණ ගන්වා ධාවනය කිරීමට සූදානම් වූ අවස්ථාවේදී දැරිය ටිපර් රථයට යට වීමෙන් මරණය සිදුව ඇති බවට සිදුකල විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**